00507

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන 2018/2019

අවසාන පරීක්ෂණය (පළමුවන කොටස) -2019

**STP8502/ESP2202** - අධ්‍යාපනයේ පදනම

කාලය - පැය තුනයි.

---

දිනය -2020.01.19 වේලාව- පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. යුනෙස්කෝ සංවිධානය විසින් හඳුන්වා දී ඇති අධ්‍යාපනයේ ප්‍රධාන කුළුණු හතර (04) නම් කරන්න.

02. "අධ්‍යාපනය යනු කිසියම් ක්‍රියාවලින් සමුදායක් තුළින් පුද්ගලයා තුළ යහපත් මානසිකත්වයක් වර්ධනය කිරීමයි." (R.S.Peters) මෙම ප්‍රකාශයට අදාළව අධ්‍යාපනයේ භූමිකා තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

03. සමාජ ස්ථරායනය පිළිබඳව සමාජ විද්‍යාඥයන් හඳුනා ගෙන ඇති මූලික ස්ථරායන පද්ධති මොනවා ද? ඒවා ලැයිස්තු ගත කරන්න.

04. දර්ශනයට අදාළව සාකච්ඡා කර ඇති න්‍යාය පද්ධති හතර (04) කෙටියෙන් විස්තර කරන්න.

05. අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සැලකීමේ දී සම්පත් නාස්තිය හා අපතේ යෑම වැළැක්වීම අවශ්‍ය වේ . රටක එසේ සම්පත් නාස්තිය හා අපතේ යෑම සිදුවන අවස්ථා කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පවුල ප්‍රධාන කාර්යයන් හතරක් ඉටු කරන බව මර්ඩොක් (1949) තර්ක කරයි. ඉන් අධ්‍යාපනයට අදාළව පවුලේ කාර්යභාරයන් කෙටියෙන් විස්තර කරන්න.

07. සැමට අධ්‍යාපනය ලබාදීම නූතන රාජ්‍යයන්ගේ වගකීම ලෙස සැලකේ. සැමට අධ්‍යාපනය ලබාදීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අභියෝග පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. ප්ලේටෝ අධ්‍යාපනය මගින් දාර්ශනික ඥාණය ඇති කිරීම අරමුණු කරගත් බව දැකිය හැකි ය. ඔහුගේ දර්ශනය තුළ දැකිය හැකි ප්‍රධාන අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

## 2 වන කොටස.

09. "සමාජානුයෝජනය පවත්නා ලෝකයට හෝ ලෝකයේ ඛණ්ඩයකට සාමාජිකයන් නොවන අයට ඇතුළුවීමේ දී මූණ ගැසෙන හා එම ප්‍රවේශය ව්‍යුහගත කිරීමට ආධාර දෙන ක්‍රියාකාරකමයි." (Wentworth, 1980)

(i) (අ) ප්‍රතිමාන යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 03)

(ආ) වර්තමානයේ යෞවනයන් කෙරෙහි බලපාන සංස්කෘතික ප්‍රතිමාන තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) සමාජානුයෝජනයේ වර්ග දෙකක් ඇත. එනම් 'ප්‍රාථමික සමාජානුයෝජනය' හා 'ද්විතියික සමාජානුයෝජනය' වශයෙනි. මෙම සමාජානුයෝජන සංකල්ප දෙක **(02)** උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) සමාජානුයෝජන කාරකයක් ලෙස වර්තමාන පාසල්වල කාර්යභාරය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

10. "සංවර්ධනය යනු යම් දෙයක වඩා උසස් තත්ත්වයක් කෙරෙහි වර්ධනයක් ලෙස අර්ථකථනය කළ හැකි ය."

(i) අධ්‍යාපනය හා සංවර්ධනය යන සංකල්ප දෙක එකිනෙකට සම්බන්ධ වන අතර එකම අරමුණක් කරා යන ක්‍රියාවලින් දෙකක් වේ. කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ii) දියුණු වෙමින් පවතින රටවල සංවර්ධනය සම්බන්ධව අධ්‍යාපනයට පැවරී ඇති වගකීම් පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ඉහත ඔබ විසින් සඳහන් කරන ලද වගකීම් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගත හැකි උපායමාර්ග හතරක් **(04)** යෝජනා කරන්න. (ලකුණු 08)

11. "ගුරුවරයාට අධ්‍යාපන දර්ශනය පිළිබඳ දැනුම අවශ්‍ය වේ."

(i) විශ්ලේෂණාත්මක අධ්‍යාපන දර්ශනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? විස්තර කරන්න. (ලකුණු 04)

(ii) ගුරුවරයාට අධ්‍යාපන දර්ශනය පිළිබඳ දැනුම අවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු හතරක් **(04)** සහිතව සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

(iii) ජීන් ජැක් රූසෝ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සැලැස්ම ශ්‍රී ලංකාවට යොදා ගත හැකි ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 08)

12. "අධ්‍යාපන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත ගුරුවරයකු ලෙස ඔබට අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඇත."

(i) අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු අතර වෙනස විස්තර කරන්න. (ලකුණු 04)

(ii) ජාතික අධ්‍යාපන කොමිසම විසින් අධ්‍යාපනයට හඳුන්වා දී ඇති මූලික නිපුණතා නම් කර, ඉන් එකක් ශ්‍රී ලාංකික සංදර්භයට අදාළ වන්නේ කෙලෙසින් දැයි විග්‍රහ කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණක් වන්නේ වැඩලෝකයට පුහුණු ශ්‍රම හමුදාවක් සැපයීමයි. ඔබ ඉහත ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සඳහා හේතු හතරක් **(04)** දෙන්න. (ලකුණු 08)

13. "අධ්‍යාපනය යනු සමාජ ජීවිතය සඳහා සූදානම් වන පිරිසක් වෙනුවෙන් වැඩිහිටියන් විසින් මෙහෙයවනු ලබන ක්‍රියාවලියකි." (එමිල් ඩර්ක්හයිම්)

(i) විධිමත් අධ්‍යාපනය සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) විධිමත් අධ්‍යාපනයේ ප්‍රබලතා තුනක් **(03)** හා දුබලතා තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) (අ) වැඩිහිටි අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන බාධක තුනක් **(03)** සඳහන් කර, ඒවා අවම කර ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

14. "අධ්‍යාපනය පන්ති ව්‍යුහය විවෘත කොට එය නොමැති විට ඇති වන තත්ත්වයන්ට වඩා පන්ති තනතුරු හරහා වඩා හොඳ සංසරණයකට ඉඩ පාදයි. " (Tumin & Feldman)

(i) සමාජ සචලතාව යන සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) පහළ සමාජ පන්තික සිසුන් මුහුණ දෙන අවාසිදායක තත්ත්වයන් පහක් **(05)** නම් කර, ඉන් එකක් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපනය සමාජ සචලතා උපකරණයකි. ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර හේතු හතරක් **(04)** සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.